Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

09 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2024 | 33 S I,II

නම: ............................................ ඉතිහාසය කාලය පැය දෙකයි

උපදෙස් :

I කොටස

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01) ක්‍රි.ව.1765 වසරේදී සිදුවූ ලන්දේසීන්ගේ උඩරට ආක්‍රමණයත් සමඟ කීර්ති ශ්‍රී රාජසිංහ රජු ආරක්ෂාව පතා ,
  i. හඟුරන්කෙත ප්‍රදේශයට පලායන ලදි. ii. උඩුදුම්බර ප්‍රදේශයට පලායන ලදි.
  iii. රන්දෙනිගල ප්‍රදේශයට පලායන ලදි. iv. ගන්නෝරුව ප්‍රදේශයට පලායන ලදි.

02) මෙරට දේශපාලන බලය ගොඩනගා ගත් යුරෝපීය ජාතීන් අතරින් උඩරට රාජ්‍ය සමඟ යහපත් සුහඳ සබඳතාවක් ගොඩනගාගත් ජාතීන් කවුද?
  i. ඉංග්‍රීසීන් ii. පෘතුග්‍රීසීන් iii. ස්පාඤ්ඤයින් iv. ලන්දේසීන්

03) ක්‍රි.ව.1815 ඉංග්‍රීසීන්ගේ උඩරට ආක්‍රමණයත් සමඟ ශ්‍රී වික්‍රමරාජසිංහ රජු බිසෝවරුන් සමග සැඟවී සිටි ස්ථානය කුමක් ද?
  i. කුණ්ඩසාලේ ii. උඩුනුවර ප්‍රදේශය
  iii. මැද මහනුවර බෝමුරේ iv. දුම්බර ප්‍රදේශය

04) " ත්‍රී සිංහලාධීශ්වර" යන නාමය භාවිත කළ උඩරට පාලකයා කවුරුන් ද?
  i.ශ්‍රී වික්‍රමරාජසිංහ රජු ii. දෙවන රාජසිංහ රජු
  iii. නිශ්ශංකමල්ල රජු iv. පළමු විමලධර්මසූරිය රජු

05) ලන්දේසීන් පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගමේ මූලස්ථානය පිහිටුවාගත් දූපත කුමක්ද?
  i. සුමාත්‍රා ii. පිලිපීන iii. ජපන් vi. ජාවා

- 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

06) පූජ්‍ය බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමියන්ගේ මූලිකත්වයෙන් පිහිටුවන ලද ගාල්ලේ ............................................ මුද්‍රණාලය මෙරට පළමු බෞද්ධ මුද්‍රණාලය ලෙස සැළකේ.

07) ඉන්දීය නිදහස් සටනේ දී විශිෂ්ට සේවයක් ඉටු කළ ............................................ මහතා වසර අටක්ම ඉන්දීය ජාතික සංගමයේ සභාපති ලෙස කටයුතු කරන ලදි.

08) ක්‍රි.ව.1818 නිදහස් සටන ............................................ ප්‍රදේශය මූලික කරගෙන ආරම්භ විය.

09) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා අනුව ............................................ ට ව්‍යවස්ථාදායක සභාවේ මූලාසනය හිමි විය.

10) ඉංග්‍රීසීන් 1795 වසරේ දී ත්‍රිකුණාමලයේ පිහිටි ............................................ කොටුවට පහර දී අල්ලා ගන්නා ලදි.

(ආණ්ඩුකාරවරයා, මාතලේ, සුදර්ශන, ලංකෝපකාර, ඌව වෙල්ලස්ස, මවුලානා, අබුල් කලාම්, අසාද්, බාල් ගංගාධාර් තිලක්, ෆෙඩ්රික් )

- පහත වාක්‍ය හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

11) කීර්ති ශ්‍රී රාජසිංහ රජු පරණතල කුඩා උන්නාන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලා කිහිපනමකට රාජද්‍රෝහී චෝදනා එල්ල කොට මරණීය දණ්ඩනය පනවන ලදි. (...........)

12 පළමු ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දීම හා ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් කිරීම සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය විසින් සිදුකරන ලදි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

13) ''මුස්ලිම් නෙයිසන්'' පුවත්පත ආරම්භකරන ලද්දේ පොන්නම්බලම් රාමනාදන් මහතා විසිනි. (............)

14) උපකාරක ගිවිසුම් ක්‍රමය යටතේ ඉංග්‍රීසිහු හයිද්‍රාබාද් ප්‍රදේශය අත්පත් කරගන්නා ලදි. (............)

15) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම සෝල්බරි ආණ්ඩුක්‍රමයේ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි (............)

• ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා වඩාත් නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

16) ලන්දේසී අධිකරණ ක්‍රමයේ දී .................................... උසාවිය ''ලැන් රාද්'' යනුවෙන් හඳුන්වා ඇත.

17) කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවීමට පැමිණි .................................... ලංකාවට පැමිනි ප්‍රථම ඉංග්‍රීසි දූතයා ලෙස ඉතිහාසගත වී ඇත.

18) ලංකාවේ පළමු තේ පර්යේෂණ මධ්‍යස්ථානය .................................................... ප්‍රදේශයේ පිහිටුවා ඇත.

19) ක්‍රෘව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ............................................................... මහතා ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්වූ ප්‍රථම උගත් ලාංකික නියෝජිතයා බවට පත්විය.

20) ඉන්දීය නිදහස් සටන් සමයේ දී නඩු විභාගයකින් තොරව ඕනෑම පුද්ගලයෙකු වසර දෙකක් බන්ධනාගාර ගත කිරීමට ඉංග්‍රීසීන්ට බලය ලැබුණේ .................................... පනත මගිනි.

## II කොටස

සැලකිය යුතුයි.

• පළමු ප්‍රශ්නය සඳහා අනිවාර්යෙන්ම පිළිතුරු සැපයිය යුතුය.
• දෙවන කොටසින් තෝරාගත් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතුයි.
• පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

01) අ) i. A ඡායාරූපයෙන් දැක්වෙන ආයතනය හඳුනාගෙන නම් කරන්න.

ii. එම ආයතනය මඟින් සිදු වූ කාර්යය කුමක් ද?

iii. මෙම ආයතනය හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

iv. මෙම ආයතනයේ නිල කාලය කොපමණද? (ල.04)



A රූපය



ආ) i. B රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?


ii. ඔහු ඉන්දියාවේ කුමන ප්‍රදේශයක උපත ලැබුවේ ද?

iii. මොහු අවස්ථා කීපයක දී සභාපති ධූරය දැරූ සංගමය කුමක්ද?

iv. මෙතුමා හඳුන්වන අන්වර්ථ නාමය කුමක් ද? (ල.04)

B රූපය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com





ඈ) i. වස්කෝදගාමා ඉන්දියාවට ගොඩබට වරාය ඉංග්‍රීසි **C** අක්ෂරයෙන් දැක්වේ. එම වරාය කුමක්ද ?

ii. ඉංග්‍රීසි D අක්ෂරයෙන් දැක්වෙන්නේ 1761 වර්ෂයේ දී ඉංග්‍රීසීන්ට යටත් වූ ප්‍රදේශයකි එය හඳුනාගෙන නම්කරන්න.

**iii.** ඉන්දියාවෙන් බෙදී වෙන් වූ බෙංගාල ප්‍රදේශය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද**?**

iv. සිපොයි භටයන් විසින් අල්ලාගන්නා ලද ප්‍රධාන නගරයක් ඉංග්‍රීසි **E** අක්ෂරයෙන් දැක්වේ. එම නගරය කුමක්ද ? (ල.04)




ඇ ) i. දෙවන නිදහස් සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූ මාතලේ දැක්වෙන අක්ෂරය කුමක්ද?

ii. ක්‍රි.ව. 1795 දී ඉංග්‍රීසීන් විසින් අල්ලා ගත් ත්‍රිකුණාමලය වරාය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක්ද ?

iii. කලාවැව දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක්ද ?

**iv.** ජොරිස් වැන් ස්පිල් බර්ජන් ලංකාවට ගොඩබට වරාය ඉංග්‍රීසි **D** අක්ෂරයෙන් දැක්වේ. එම වරාය කුමක්ද ? (ල.04)

## II කොටස

02) i. පහත සඳහන් A හා B වලින් දක්වා ඇති එක් එක් කරුණට අදාළ පිළිතුර නිවැරදිව ලියා දක්වන්න.

**(A)** ස්පාඤ්ඤයේ දෙවන පිලිප් රජු ලංදේසීන්ට ඇතුළු වීමට තහනම් කළ වරාය කුමක් ද?

**(B)** දෙවන රාජසිංහ රජු ඉතා අලංකාර පෙරහැරකින් කැඳවාගෙන ගිය බවට තොරතුරු සඳහන් ලන්දේසි දූතයා කවරෙක්ද?

**(C)** උඩරට පළමු නායක්කර් වංශික පාළකයා කවුරුන් ද? ( ල.03)

ii. කුරුඳු තලන්නන්ගෙන් අති විශාල ලාභ ලැබීමට ලන්දේසීන් ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල.04)

iii. ලන්දේසීන් විසින් තම ආනයනික වියදම් අඩුකර ගැනීමට හා අමතරව දේශීය ආදායම් ලබාගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග හතරක් නම්කරන්න (ල.04)

03) i. 1818 නිදහස් සටනට තුඩුදුන් හේතු තුනක් ලියන්න. (ල.03)

ii. පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු A,B,C,D අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - ක්‍රි.ව 1833 වර්ෂයේ දී ඉංග්‍රීසීන් ලංකාවට හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක්ද?

B - ලංකාවේ සමුපකාර සමිති ව්‍යාපාරය ආරම්භ කළ ආණ්ඩුකාරවරයා නම් කරන්න.


C - වාරිමාර්ග පිළිබඳ සොයා බැලීම සඳහා කොමිසමක් පත්කළ ආණ්ඩුකාරවරයා නම් කරන්න.

D - ලංකාවේ පළමු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ල.04)

iii. ක්‍රි.ව.1848 සටන ඇතිවීමට බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හතරක් නම් කරන්න. (ල.04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04) **ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවනය** පාඩම ඇසුරෙන් පහත ඡායාරූපසටහනට අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න.

| ඡායාරූප | ප්‍රශ්න |
|---|---|
|  A | 1) මෙම ඡායාරූපයෙන් දැක්වෙන පාසල කුමක් ද?<br>..........<br>2) එය පිහිටා ඇති ප්‍රදේශය නම් කරන්න<br>..........<br>3) එය ආරම්භ කරනලද මිෂනාරි සංවිධානය කුමක් ද?<br>.......... |
| B  C  | 4) B හා C ඡායාරූප වලින් දැක්වෙන පුද්ගලයන් දෙදෙනා අතරින් ඉස්ලාම් ආගමික පුනරුදයට නායකත්වය දැක්වෙන පුද්ගලයා දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද? ..........<br>5) එතුමාගේ නම කුමක් ද?..........<br>6) මෙම පුද්ගලයන් දෙදෙනා අතරින් උදයභානු පුවත්පත ආරම්භකරන ලද පුද්ගලයාගේ නම කුමක් ද? ..........<br>7) එතුමා විසින් දෙමළ සිසුන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීමට ආරම්භ කරන ලද පාසල කුමක් ද?<br>.......... |
| D  E  | 8) මෙම ඡායාරූප වලින් දැක්වෙන ස්වාමීන් වහන්සේලා අතරින් මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවන පිහිටුවීමට මූලිකත්වය ගත් ස්වාමීන් වහන්සේ හඳුනාගෙන නම්කරන්න<br>..........<br>9) උන්වහන්සේ විසින් රචනාකරන ලද කෘතියක් නම්කරන්න..........<br>10) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?<br>..........<br>11) උන්වහන්සේ සම්බන්ධ වූ ප්‍රසිද්ධ වාදයක් නම් කරන්න .......... |

05) i. ඉන්දියානු ජාතික සංගමය අන්තවාදීන්ගේ බලපෑමට ලක්ව තිබූ අවධියේ අන්තවාදීන්ට නායකත්වය ලබාදුන් තිදෙනෙකු නම් කරන්න. (ල.03)

ii. ඉන්දියාවට නිදහස ලබාගැනීම සඳහා මහත්මා ගාන්ධිතුමාගේ මඟ පෙන්වීම මත අනුගමනය කළ අවිහිංසාවාදී සටන් උපක්‍රම හතරක් ලියන්න. (ල.04)

iii. ඉන්දියාවට නිදහස ලබාගැනීම සඳහා 1920 වර්ෂයෙන් පසු ජාතික සංගමය අනුගමනය කළ ක්‍රියාමාර්ග හතරක් නම්කරන්න. (ල.04)

06) i. (A) එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා විසින් පිහිටුවන ලද දේශපාලන පක්ෂය කුමක් ද?

(B) ශ්‍රී ලංකාවේ පළමුවන ජනාධිපතිවරයා කවුරුන් ද?

(C) දෙවන ජනරජ ව්‍යවස්ථාව හඳුන්වාදෙන අවධියේ මෙරට අගමැති ධුරය දරනු ලැබුවේ කවුරුන් ද? (ල.03)

ii. 1972 ජනරජ ව්‍යවස්ථාව අනුව ඉහළම අධිකරණ ආයතන දෙක නම් කරන්න. (ල.04)

iii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරෙන කාර්යයන් හතරක් නම් කරන්න (ල.04)

07) i. ශ්‍රී ලංකාවේ පළමු අගමැතිවරුන් තිදෙනා පිළිවෙළින් නම් කරන්න (ල.03)

ii. නිදහසෙන් පසු බිහිවූ රජයන් වී ගොවිතැන දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න (ල.04)

iii. නිදහසෙන් පසු බිහිවූ රජයන් අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම පිණිස සහනාධාර

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ඉතිහාසය 9 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය**

**I කොටස**

01) i 02) iv 03) iii 04) ii
05) iv 06) ලංකෝපකාර 07) මවුලානා අබුල් කලාම් අසාද් 08) ඌව වෙල්ලස්ස
9) ආණ්ඩුකාරවරයා 10) පෙඩ්රික් 11) X
12) ✓ 13) X 14) ✓ 15) ✓
16) ඉඩම් උසාවිය 17) ජෝන් පයිබස් 18) තලවකැලේ
19) පොන්නම්බලම් රාමනාදන් 20) රෝලට්

**II කොටස**

01) ඇ) i. පැරණි පාර්ලිමේන්තුව
ii. ව්‍යවස්ථාදායක කාර්ය/ නීතිරීති පැනවීම iii. සෝල්බරි iv. වසර පහකි
ආ) i. දඩාබායි නඖරෝජි ii. බොම්බාය
iii. ඉන්දියානු ජාතික සංගමය
iv. සම්භාවනීය මහල්ලා
ඇ) i. කැලිකට් ii. පොන්ඩිචෙරි **iii. B** **iv.** දිල්ලිය
ඈ ) i. **E** ii. C **iii. A** **iv.** මඩකළපුව

02) i. (A) ලිස්බන්
(B) ජෙරාඩ් හල්ෆ්ට්
(C) ශ්‍රී විජයරාජසිංහ රජතුමා

ii. කුරුඳු එක්රැස් කිරීම හා වෙළඳාම සඳහා පැවති මහබද්දේ දෙපාර්තමේන්තුවට ලන්දේසින් විසින් වෙනම කපිතාන්වරයෙකු පත්කිරීම.කුරුඳු තැලීම හා එක්රැස් කිරීමට සම්ප්‍රදායික රාජකාරි ශ්‍රම ක්‍රමය යොදාගැනීම. කුරුඳු තලන්නන්ගේ නම් ලේඛන ගත කොට ඔවුන්ගෙන් උපරිම සේවය ලබාගැනීමට ක්‍රියාකිරීම. වැඩිහිටි කුරුඳු තලන්නෙකු නිශ්චිත කුරුඳු ප්‍රමාණයක් සමාගමට වාර්ෂිකව නොමිලේ තලා දිය යුතුය.

iii. මුතුරාජවෙල අස්වැද්දීමට කටයුතු කිරීම. යෝධ වැව හා කන්තලේ වැව ආදී වැව් ප්‍රතිසංස්කරණය කිරීම මගින් වී නිෂ්පාදනය වැඩිකිරීමට උත්සහ ගැනීම.
උක්, ගම්මිරිස්, එනසල්, කෝපි, මල්බෙරි, ඉන්ඩිගෝ ආදී වගාවන් දියුණු කිරීම.
හැමිල්ටන් ඇල මාර්ගය ඉදිකොට ඒවා භාණ්ඩ ප්‍රවාහනයට යොදාගැනීම.

03) i. රජෙකු නොමැති වීම නිසා ජනතාව තුළ ඇති වූ කලකිරීම.
බ්‍රිතාන්‍යයන්ගේ පාලනය යටතේ බුදු දහම විනාශ වෙතැයි බියක් ඇතිවීම.
රදළ පන්තියට පහර වැදීම (පෙළපොත පිටු අංක 35)

ii. A කෝල්බෲක් B - මැකලම් ආණ්ඩුකාරවරයා C - හර්කියුලිස් රොබින්සන් ආණ්ඩුකාරවරයා
D - පෙඩ්රික් නෝර්ත්

iii. පෙළපොත පිටු අංක 38

04)

| ප්‍ර.අ | පිළිතුර | ප්‍ර.අ | පිළිතුර | ප්‍ර.අ | පිළිතුර |
|---|---|---|---|---|---|
| 1 | **රිච්මන්ඩ්** | 5 | M.C.**සිද්දිලෙබ්බේ** | 9 | **සිදත් සගරා සන්නය/කාව්‍යශේඛර සන්නය** |
| 2 | **ගාල්ල** | 6 | **අරුමුග නාවලර්** | 10 | E |
| 3 | **වෙස්ලියන්** | 7 | **ශිවංගල විද්‍යාලය / හිංදු විද්‍යාලය** | 11 | **පංචමහා වාද වලින් එකක්** |
| 4 | C | 8 | **හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි** | 12 | |

05) i. ලාල් ලජපත්රායි , බාල් ගංගාධාර් තිලක්, බිපන් චන්ද්‍රපාල්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ii. සත්‍යාග්‍රහ පැවැත්වීම, රජයට සහය නොදැක්වීම, විරෝධතා පාගමන් සංවිධානය, සිවිල් නීතිය කඩකිරීම.

iii.

- 1921 වර්ෂයේ සහයෝගිතා වර්ජන ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම
- 1928 වර්ෂයේ ඉන්දියාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳව සොයාබලා නිර්දේශ ලබා දීමට බලධාරීන් පත් කළ සීමන් කොමිසමට එරෙහිව හර්තාල් ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම
- 1928 වර්ෂයේ ඉන්දියාවේ සියලු පක්ෂ සහභාගි කර ගත් සර්වපාක්ෂික සමුළුවක් කැඳවා ඉන්දියාවට ගැළපෙන ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට කටයුතු කිරීම
- 1929 වර්ෂයේ පූර්ණ ස්වරාජ්‍ය සංකල්පය හෙවත් ඉන්දියාවට නිදහස ලබා ගැනීම ජාතික සංගමයේ අරමුණ බවට පත් කොට ඒ සඳහා ක්‍රියාත්මක වීම
- 1930 වර්ෂයේ රජයට එරෙහිව සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරයක් සංවිධානය කිරීම
- 1942 වර්ෂය වන විට 'ඉංග්‍රීසීන් ඉන්දියාවෙන් පිට වෙනු' යන සටන් පාඨය මුල් කර ගෙන සත්‍යාග්‍රහයක් ක්‍රියාත්මක කිරීම

06) i. (A) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
(B) විලියම් ගොපල්ලව මහතා
(B) ජේ.ආර්. ජයවර්ධන මහතා

ii. ශ්‍රේෂ්ඨාධිකරණය හා මහාධිකරණය

iii.

මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු විසඳීම
ජනාධිපතිට විරුද්ධව පාර්ලිමේන්තුවට ගෙන එන දෝෂාභියෝග විභාග කිරීම.
ඡන්ද පෙත්සම් පිළිබඳ නඩු විභාග කිරීම.
අවසාන අභියාචනාධිකරණය ලෙස ක්‍රියාත්මක වීම.

07) i. ඩී .එස්.සේනානායක මහතා / ඩඩ්ලි සේනානායක මහතා / ජෝන් කොතලාවල මහතා

ii.

- වියළි කලාපයේ ගොවිජනපද පිහිටුවීම
- මහවැලි සංවර්ධන යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම, වී පර්යේෂණ ආයතන පිහිටුවීම, නව වී ප්‍රභේද ගොවියන්ට හඳුන්වාදීමට කටයුතු කිරීම
- ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම හා සහතික මිල ක්‍රමයක් හඳුන්වා දීම.
- රජයේ බැංකු මගින් ගොවි ජනතාවට ණය පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.

iii.

සහල් සහනාධාර ලබා දීම
ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට ආහාර මුද්දර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
අඩු ආදායම්ලාභීන්ට නිවාස ආධාර ලබා දීම හා නව නිවාස තනවා දීම.
කුඩා ඉඩම් හිමියන්ට තේ, රබර් වැනි වගාවන් සඳහා ආධාර මුදල් ලබා දීම.